

# සිල්ලර දෙවියන් මැවූ ඇය

**මායාවක් බඳු වූ පටලයකින් දෑස් අන්ධ ව නිමක් නැති දුර්ගයක මං මුලා වී සිටි ජගත් පාඨකයාට සත්‍යයේ නිරුවත පෙන්වා දුන් සිල්ලර දෙවඟන ඇයයි. මායාව නිරුවත්කොට මායාවෙන් විළි වසා ගැනීමට තැත් කරනා "කුහක පැලැන්තියේ" ගොදුරක් බවට පත් වු ක්ෂුද්‍රයාගේ ආදරණීය ආමන්ත්‍රණය "සුසෑනා අරුන්දතී රෝයි" ඇය යි.**

ඕ 1961 නොවැම්බර් මස 24 වන දින රජිව් රෝයි සහ මේරි රෝයි දෙපළට දාව ඉන්දියාවේ ඇසෑම් ප්‍රාන්තයේ ශිල්ලොං (shillong)හි දී මෙලොව එළිය දුටුවාය. මායාවක් බඳු වූ පටලයකින් දෑස් අන්ධ ව නිමක් නැති දුර්ගයක මං මුලා වී සිටි ජගත් පාඨකයාට සත්‍යයේ නිරුවත පෙන්වා දුන් සිල්ලර දෙවඟන ඇය යි. මායාව නිරුවත්කොට මායාවෙන් විළි වසා ගැනීමට තැත් කරනා "කුහක පැලැන්තියේ" ගොදුරක් බවට පත් වු ක්ෂුද්‍රයාගේ ආදරණීය ආමන්ත්‍රණය "සුසෑනා අරුන්දතී රෝයි" ඇය යි.

තමිල්නාඩුවේ ලව්ඩේල්හි ලෝරන්ස් පාසලෙන් සිය පාසල් දිවිය හමාර කල අරුන්දතී රෝයි නවදිල්ලියේ සැළසුම් හා ගෘහ නිර්මාණ ශිල්පී පාසලෙන් සිය උසස් අධ්‍යාපනය ලැබුවාය. සැබෑ ජීවිතයේදී අපට ලේඛිකාවක් පමණක් වන ඇය චිත්‍රපට නිළියක, තිර පිටපත් රචිකාවක, මෙන් ම චිත්‍රපට අධ්‍යක්ෂිකාවක් ද වන්නී ය. ගෘහ නිර්මාණ ශිල්පී 'ජෙරාඩ් කුන්හා' ඇගේ පළමු විවාහයේ සැමියා ය. අසාර්ථක වූ පළමු විවාහයෙන් පසුව ඇය දෙවන වරට විවාහ වූයේ චිත්‍රපට අධ්‍යක්ෂකවරයෙකු වූ ප්‍රදීප් ක්‍රිෂේන් සමඟ ය. ඔහු හා එක්ව යථාර්ථවාදී නිර්මාණ කිහිපයක් ම කළ රෝයි එකී ඇතැම් නිර්මාණ සඳහා ස්වකීය රංගනයෙන් ද, විටෙක තිර පිටපත් රචනයෙන් ද දායක වූවා ය.

කාන්තාවන්ගේ අයිතීන් වෙනුවෙන් සටන් කළ ඕ කාන්තාව වෙනුවෙන් බොහෝ පුවත්පත්වලට විවේචනාත්මක ලිපි ලිව්වා ය. න්‍යෂ්ඨික පිපිරීම්, නර්මදා නදිය හරහා ඉදි වූ යෝධ වේල්ල නිසා සිදු වූ මහා පරිසර විනාශයන් හා අවතැන් වීම්, බහු ජාතික සමාගම් ඉන්දියාව තුළ සිදු කරන මහා පරිමාණ සම්පත් කොල්ලකෑම්, කුල බේදය ආදිය වස්තු බීජ කර ගනිමින් මනුෂ්‍යයාගේ අකුසල චෛතසිකයන් ප්‍රබල අයුරින් විවේචනයට ලක් කිරීමට ඇය වෙර දැරුවාය. න්‍යෂ්ඨික පිපිරීම් පිළබදව අදහස් පළ කල ඇය

වරෙක,

**"අප වෙනම රාජ්‍යයක් විය හැකිය. එහෙත් අප සියලු දෙනා ජීවත් වන්නේ එකම අහසක් යට ය. එක ම සුළඟක් හා එක ම ජල ප්‍රවාහයක් භුක්ති විඳිමින්. විකිරණ ද්‍රව්‍ය පතනය සිදුවනු ඇත්තේ හමන සුළඟ හා පතිතවන වැසි ජලය අනුව ය. එවිට අප පකිස්ථානයට එරෙහිව කරන යුද්ධය අපට එරෙහිව කෙරෙන යුධ වැදීමක් ම වනු ඇත"**

ලෙස පැවසුවා ය.

වරක් ඇයට නවදිල්ලියේ තිහාර් බන්ධනාගාරයේ දිනක සිර දඬුවමක් හා ඉන්දීය රුපියල් 2000ක දඩයක් ද නියම කෙරිණි. ඇයට එරෙහිව තිබූ චෝදනාව වූයේ සර්දාර් සරෝවර් වේල්ල ඉදිකිරීම පිළිබඳ රජයේ තීරණයට විරුද්ධව පැවරූ නඩුවේදී උසාවිය රජයට පක්ෂපාතීව ලබා දුන් තීරණයට එරෙහිව ඇගේ මූලිකත්වයෙන් ඉදිරිපත් කළ පෙත්සමේ වචන භාවිතය උසාවියට අපහාස වන පරිදි සිදුකර තිබීමයි. අරුන්දතී රෝයි නැමැති චරිතයේ කැපී පෙනෙන පුරුෂ ලක්ෂණ, සෘජු ප්‍රතිපත්තිගරුක බව හා නිර්භීත බව හින්දුස්ථානී මහ පොළොවෙන් ඇය ලද ශක්තීන් බවට සැක නැත.

ඉන්දියානු අර්ධද්වීපයේ පැයූ සිල්ලර දෙවඟන ඇය යි. මායාවෙන් විළිවසා ගත් කුහක පැලැන්තියේ විවේචනයට ලක්වූ සිල්ලර දෙවඟන සමග එක්වූයේ කුලභේදවාදී ඉන්දීය සමාජයේ වරප්‍රසාද නොලත් කුල හීනයන් සහ ගෝත්‍රික ජනතාව ය. එනමුත් අරුන්දතී රෝයි එකී වරප්‍රසාද නොලත් ක්ෂුද්‍ර කුලයේ එකියක නොවීම සුවිශේෂත්වය යි. නමුත් ඇය සමස්ත ලෝකවාසී දුගී ජනතාව වෙනුවෙන් හඬ අවදි කළ මෑත යුගයේ බිහි වූ තවත් එක් සැබෑ දෙවඟනකි.

සාහිත්‍යකරුවාගේ වගකීම නම් හුදෙක් පාඨකයා ඉදිරියේ ඉන්ද්‍රජාලයක් මවනවාට වඩා සත්‍ය ප්‍රතිමූර්තිමත් කර දැක්වීමයි. සත්‍යයේ මුද්‍රාව වූ අරුන්දතී රෝයි සිය අරගලය සඳහා ප්‍රමුඛතම අවිය කරගත්තේ ලේඛන කලාව යි. අරුන්දතී රෝයි විසින් ලියා පළ කරන ලද කෘති අතරින් කිහිපයක් වශයෙන්,

An Ordinary Person's Guide to Empire (2003)
(අධිරාජ්‍ය පිළිබඳ සාමාන්‍ය වැසියාට මඟපෙන්වීමක්)

Power Politics (2000)
(බල දේශපාලනය)

The Algebra of Infinite Justice (2001)
(අනන්ත යුක්තියේ ගණිතය)

War Talk (2003)
(යුධ කතා)

Listening to Grasshoppers (2004)
(පළඟැටියන්ට ඇහුම්කන් දීම)


Broken Republic (2001)
(බිඳුණු ජනරජය)

Capitalism, A Ghost Story (2014)
(ධනවාදය, භූත කතාවක්)

The Grater Common Good (1999)
(වඩා ශ්‍රේෂ්ඨ පොදු යහපත)

විශ්ව සාහිත්‍ය අඹරේ පැයූ සුපහන් තාරකාවක් වන අරුන්දතී රෝයිගේ ප්‍රථම නව කතාව වූයේ "The God of Small Things - 1997" නවකතාවයි. ලොව පුරා භාෂා කිහිපයකට පරිවර්තනය වූ "The God of Small Things" "සිල්ලර දෙයියෝ" නමින් සිංහල බසටද පරිවර්තනය කර තිබේ. The God of Small Things නවකතාව ඉන්දියාවේ කුල භේදය සහ දේශපාලනයේ සැඟවුණු නිරුවත විදහා පාන දර්පණයයි. පීතෘ මූලික සමාජයක් තුළ බැට කෑමට ලක්වන කාන්තාවගේ කතන්දරයයි. දෘෂ්ටි මායාවන්හි පාඨකයා මුලා නොකරමින් යථාර්ථවාදී රූපණයකට ඇය දැරූ ප්‍රයත්නයයි.

අර්ධ ස්වයං චරිතාපදානයක් වන මෙයට වස්තු වනුයේ කුල භේදවාදී රාමුවට කොටුවුණු ඉපේ සොයුරන්ගේ (Ipe twins) සහ ඔවුනගේ මව අම්මුගේ (Ammu) අවාසනාවන්ත ඉරණමයි. අහිංසක ප්‍රේම වෘත්තාන්තයක්ද වන The God of Small Things අව්‍යාජ, සුන්දර, ළපටි ළමා ලෝකයේ චමත්කාරය ද සිතුවම් කරන තෙලිතුඩකි. The God of Small Things හි රෝයි මැවූ සිල්ලර දෙවියා වෙලුතා (Velutha) යි. අයමනෙම් මැදුර (Ayemenem house) අහංකාර කුලීන පැලැන්තියේ සංකේතය යි. The Touchable (වරප්‍රසාද ලත්) සහ The Untouchables (වරප්‍රසාද නොලත්) වශයෙන් සමාජය දෙකොටසකට බෙදා දක්වමින් පවුලක ගෞරවය කුල නාමය වෙනුවෙන් ඝාතනය වන කුල හීන වෙලුතා සහ හුදෙකලාවේ මියයන අම්මු සහ බිඳ වැටුණු අනාගතයක් හිමි නිවුන් සොයුරන්ගේ ජීවිත හරහා කුලභේදවාදයේ යථාර්ථය නිරූපණය කරන නිරවුල් වාර්තාවක් වන The God of Small Things ඉන්දියාවේ දුගී ජනයා ලද මාණික්‍ය ආභරණයකි.



යථාර්ථය පිළිබඳ අකල්පිත වාර්තාවක් වන The God of Small Things, 1997 දී මෑන් බුකර් (The Man Booker) සම්මානයට ද පාත්‍ර විය. එමෙන්ම 2002 ලෙනාන් පදනම විසින් පිරිනමන සංස්කෘතික නිදහස පිළිබඳ සම්මානය, 2004 දී සිඩ්නි සාම සම්මානය සහ 2011 දී ඇගේ විශිෂ්ඨ ලේඛන කලාව සඳහා වන නෝර්මන් මෙලර් යන සම්මානයන්ගෙන් ද ඇය පිදුම් ලැබුවා ය. නමුත් වරක් සිය The Algebra of Infinite Justice නම් දේශපාලන ලිපි මාලාව වෙනුවෙන් ඇයට පිරිනැමීමට නියමිතව තිබූ ඉන්දියානු සාහිත්‍ය ඇකඩමි ත්‍යාගය රෝයි තමා විසින් ම ප්‍රතික්ෂේප කළාය. ඒ ඇමෙරිකානු යුධවාදී ප්‍රතිපත්ති සහ අධිරාජ්‍යවාදී ප්‍රතිපත්ති අනුගමනය කරන සිය රටෙන් එවැනි සම්මානයක් ඇය බලාපොරොත්තු නොවූ හෙයිනි.

මෙවන් ඍජු ප්‍රතිපත්තිවලින් පරිපූර්ණ වූ නිර්භීත සිල්ලර දෙවඟනක වූ අරුන්දතී රෝයි ලොව පුරා දුගී ජනතාවගේ හද ගැස්ම යි. අසාධාරණයේ වෛරක්කාරිය යි. නිරුවත් දේශපාලන සත්‍යයේ විවේචනය යි.

ගලවා ඉවත දමුවා යැයි සිතුවත් දුෂ්ඨ බලවේග පසුපස තවමත් හඹා යන සාධාරණත්වයේ සෙවණැල්ල යි.

**ප්‍රභානි සචින්තනා මන්ත්‍රීරත්න**

# හිතකර පරිගණක භාවිතයකට මඟ

පරිගණකය භාවිතය නිසා අප
දැනුවත්ව හෝ නොදැනුවත්ව ම
අපගේ ශරීරයට මනසට
ඇතිවන ශාරීරික හෝ මානසික
පීඩා බොහෝ ය.
මේ අතර
**ඇස් වියළීම, ඇසේ වේදනාව,**
**ගෙල පිටුපස හා**
**මැණික් කටුව ආශ්‍රිත වේදනා**
ඇතිවීම සුලබ තත්වයක්
ලෙස දැකිය හැක.

**ව**ර්තමානය වන විට අපගේ තරුණ පරම්පරාව මෙන් ම බොහෝ පිරිසක් පරිගණකය භාවිත කිරීමට හුරු වී සිටිති. නැතහොත් ඒ ආශ්‍රිත රැකියාවක හෝ නිරත වී සිටිය හැක. ඒ තරමටම පරිගණකය (computer or laptop) අපේ ජීවිතයට සමීප වී ඇත.

නමුත් පරිගණකය භාවිතය නිසා අප දැනුවත්ව හෝ නොදැනුවත්ව ම අපගේ ශරීරයට මනසට ඇතිවන ශාරීරික හෝ මානසික පීඩා බොහෝ ය. මේ අතර ඇස් වියළීම, ඇස් වේදනා, ගෙල පිටුපස හා මැණික් කටුව ආශ්‍රිත වේදනා ඇති වීම සුලබ තත්වයක් ලෙස දැකිය හැක. විශේෂයෙන් පරිගණකය දීර්ඝ වෙලාවක් භාවිත කරන පුද්ගලයන් මේ නිසා දැඩි ලෙස පීඩා විඳින අවස්ථා දැක ගත හැකි ය.